දිනය: හිජ්රි 1448 රබීඋනිල් අව්වල් 22 / ක්‍රි.ව. 2026 සැප්තැම්බර් 4

# මාතෘකාව: අසුබ නිමිති බැලීම, එහි අනතුරු සහ පිළියම

සියලු ප්‍රශංසා අල්ලාහ්ටම හිමිය. අපි ඔහුවම ප්‍රශංසා කරන්නෙමු, ඔහුගෙන්ම පිහිට පතන්නෙමු, ඔහුගෙන්ම සමාව අයදින්නෙමු. අපගේ ආත්මයන්හි ඇති නපුරෙන් සහ අපගේ නරක ක්‍රියාවන්ගෙන් අපි මහා කාරුණික අල්ලාහ්ගෙන් ආරක්ෂාව පතන්නෙමු. අල්ලාහ් යමෙකුට මඟ පෙන්වන්නේද, ඔහුව නොමඟ යැවිය හැකි කිසිවෙකුත් නොමැත. ඔහු යමෙකු මුළා වීමට හැරියේද, ඔහුට මඟ පෙන්විය හැකි කිසිවෙකුත් නොමැත.

නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් කිසිඳු දෙවියෙකු නොමැති බවත්, ඔහු ඒකීය බවත්, ඔහුට කිසිදු සහකරුවෙකු නොමැති බවත් මම සාක්ෂි දරමි. තවද මුහම්මද් (සල්) තුමාණන් ඔහුගේ ගැත්තා සහ දූතයා බවට මම සාක්ෂි දරමි.

{ විශ්වාස කළවුනි, අල්ලාහ්ට බිය විය යුතු අයුරින් ඔහුට බිය වවු. තවද නුඹලා සැබැවින්ම (සැබෑ) මුස්ලිම්වරුන් වශයෙන්ම මිස මිය නොයවු.}

[ආල ඉම්රාන්: 102]

අහෝ මුස්ලිම්වරුනි! කෙනෙකුගේ සැබෑ විශ්වාසයට (ඊමානයට) සහ දහමට බලපාන, මෙන්ම ඔහුගේ ඒකදේවවාදයට (තව්හීදයට) සහ ස්ථිර විශ්වාසයට හානි කරන සියලු දේවල්වලින් වැළකී සිටීම නිවැරදි ඊමානයේ සහ සම්පූර්ණ තව්හීදයේ අවශ්‍යතාවයකි. අපගේ ඍජු දහම විසින් අවලංගු කරන ලද සහ අපගේ උතුම් නබි (සල්) තුමාණන් විසින් අපට අනතුරු අඟවන ලද ජාහිලියා (නූගත්) යුගයේ පුරුදු අතරින් එකක් වනුයේ අසුබ නිමිති බැලීම. මක්නිසාද යත්, මෙය සිදුකරන පුද්ගලයා තමා අපේක්ෂා කරන දේ ලබා ගැනීමට සහ තමා බිය වන දෙයින් ගැලවීම සඳහා අල්ලාහ් හැර වෙනත් දෑ වෙත සිය හදවත යොමු කරන බැවිනි.

අවිශ්වාසවන්තයින් පක්ෂීන්ගෙන් අසුබ නිමිති බැලීමට පුරුදුව සිටියෝය. කුරුල්ලෙකු දකුණු පැත්තට පියඹා ගියහොත් ඔවුන් එය 'සුබයි' යැයි පවසා තමන් කිරීමට අදහස් කළ දේ කිරීමට ඉදිරිපත් වූහ. කුරුල්ලා වම් පැත්තට පියඹා ගියහොත් එය 'අසුබයි' (නරකයි) යැයි පවසා එම ක්‍රියාවෙන් වැළකී සිටියහ. තවද කපුටෙකු ඔවුන්ගෙන්

කෙනෙකුගේ නිවසක වැසුවහොත් ඔවුන් එය අසුබ නිමිත්තක් ලෙස සලකා නපුරක් සිදුවනු ඇතැයි බිය වූහ.

අල්ලාහ්ගේ ගැත්තනි! අසුබ නිමිති බැලීමට (හෝ අසුබවාදී ලෙස සිතීමට) විවිධ ස්වරූප සහ බොහෝ උදාහරණ ඇත. එයින් සමහරක් නම්: ක්‍රිස්තියානීන් විශ්වාස කරන ආකාරයට දහතුන වැනි නිශ්චිත අංකයක් අසුබ යැයි සැලකීමයි. නැතහොත් යම් පුද්ගලයෙකුගෙන් අසුබ නිමිති බැලීමයි. එනම් "අසවලාගේ මුහුණ අසුබයි (මූසලයි), මා ඔහු සමඟ ගමන් කරන සෑම විටම මට මෙවැනි මෙවැනි කරදර සිදු වේ" යැයි පැවසීමයි. නැතහොත් සමහරු පවසන "කෛර් යා තයිර්" (අරාබිවරුන් අතර කුරුල්ලන්ගෙන් නිමිති බැලීමේදී භාවිතා වූ කියමනක්) වැනි දේ පැවසීමයි. මේ සියල්ල තහනම් කරන ලද (වළක්වන ලද) දේවල්ය. මක්නිසාද යත්, යහපත අතිඋතුම් වූ අල්ලාහ්ගෙන් මිස අන් කිසිවකුගෙන් නොපැමිණෙන බැවිනි. සියලු යහපත ඇත්තේ ඔහුගේ අතෙහිමය. තවද සියලු කරුණු නැවත හරවා යවනු ලබන්නේ ඔහු වෙතටමය.

අසුබ නිමිති බැලීම යනු සැබවින්ම ෂෙයිතාන්ගේ බලපෑමක්, ඔහුගේ බිය ගැන්වීමක් සහ ඔහුගේ රහස් කොඳුරුමක් වේ. තවද එය අල්ලාහ් හැර අන් දේවල් කෙරෙහි විශ්වාසය තැබීමක් සහ අල්ලාහ් කෙරෙහි ඇති කරගන්නා නරක සිතුවිල්ලක් වේ. මන්දයත්, මෙය සිදුකරන පුද්ගලයා අල්ලාහ් හැර වෙනත් දෙයකට යහපත හා අයහපත (හානිය) සිදුකළ හැකියැයි විශ්වාස කරන බැවිනි. එබැවින් එයට එරෙහිව ක්‍රියා කිරීම සහ එය සමාජයෙන් මුලිනුපුටා දැමීම අනිවාර්ය වගකීමකි. විශේෂයෙන්ම නබි (සල්) තුමාණන් එය 'ෂිර්ක්' (අල්ලාහ්ට ආදේශ කිරීමක්) ලෙස නම් කර ඒ ගැන තම සමාජයට අනතුරු අඟවා ඇති බැවිනි.

ඉබ්නු මස්ඌද් (රළි) තුමාණන්ගෙන් වාර්තා වේ, එතුමා පැවසීය: රසූල් වන මුහම්මද් (සල්) තුමාණන් මෙසේ පැවසූහ: **"අත්-තියරා (අසුබ නිමිති බැලීම) යනු ෂිර්ක් වේ. අත්-තියරා යනු ෂිර්ක් වේ."**

[ග්‍රන්ථය: අහ්මද් සහ අබූ දාවූද්].

තවද 'අත්-තියරා' යනු අසුබ නිමිති බැලීමේ එක් ප්‍රධාන ස්වරූපයකි.

අසුබ නිමිති බැලීම (අත්-තතයියුර්) යනු රසූල්වරුන්ගේ සතුරන් වූ ප්‍රතික්ෂේප කරන්නන්ගේ (කාෆිර්වරුන්ගේ) ලක්ෂණවලින් එකකි. ෆිර්අවුන්ගේ ජනතාවට යම් විපතක් හෝ නියඟයක් ඇති වූ විට, තමන්ට පැමිණි එම විපත මූසා (අල්ලාහ්ගේ

ශාන්තිය ඔහු මත ඇති වේවා) තුමාණන්ගේ සහ ඔහුගේ ජනතාවගේ අසුබතාවය (මූසලකම) නිසා සිදුවූවක් යැයි ඔවුහු පැවසූහ.

මහා කාරුණික අල්ලාහු තආලා මෙසේ පවසයි: { ඔවුනට යහපත පැමිණි විට “මෙය අපටමය” යැයි ඔවුහු පැවසූහ. ඔවුනට යම් අයහපතක් සිදු වූ විට (එය) අසුභ නිමිත්තක් ලෙස මූසා හා ඔහු සමග වූවන්ට ආරෝපණය කළෝය.}

[අල්-අඃරාෆ්: 131].

එවිට අල්ලාහ් ඔවුන්ට මෙසේ පිළිතුරු දුන්නේය: { දැන ගනිවු. ඔවුන්ගේ අසුභ නිමිති ඇත්තේ අල්ලාහ් අබියසය.} එනම් ඔවුන්ට පැමිණි එම විපත් සැබවින්ම ඔවුන්ගේ ප්‍රතික්ෂේප කිරීම, ඔවුන්ගේ පාපයන් සහ ඔවුන් මූසා (අල්ලාහ්ගේ ශාන්තිය ඔහු මත ඇති වේවා) තුමාණන්ව බොරු කිරීම හේතුවෙන් අල්ලාහ්ගේ තීරණයට හා දෛවයට අනුව සිදුවූවකි. ඉන්පසු ඔහු (අල්ලාහ්) ඔවුන්ගෙන් බහුතරයක් නූගතුන් යැයි විස්තර කරමින් මෙසේ පැවසූහ: {එනමුත් ඔවුන්ගෙන් බහුතරය (ඒ බව) නොදනිති}.

නමුත් ඒකදේවවාදය පිළිගන්නා සැබෑ විශ්වාසවන්තයින්ගේ (මුඃමින්වරුන්ගේ) තත්වය නම්, ඔවුන් ඒකදේවත්වය සම්බන්ධයෙන් දැඩි ලෙස ආරක්ෂාකාරී වන අතර, එයට හානි කරන ක්‍රියාවලට එරෙහිව දැඩි ලෙස විරුද්ධ වීමයි.

දිනක් කුරුල්ලෙකු ශබ්ද නගමින් පියඹා ගිය විට, එක් මිනිසෙක් "සුබයි, සුබයි යැයි පැවසීය. එවිට ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හුමා) තුමාණෝ: "(එහි) සුබයක් ද නැත, අසුබයක් ද නැත" යැයි පැවසූහ. යහපතක් හෝ අයහපතක් ඇති කිරීම කෙරෙහි කුරුල්ලෙකුට බලපෑමක් කළ හැකි යන විශ්වාසය එම මිනිසා තුළ ඇති නොවීම සඳහා, එතුමාණෝ වහාම ඔහුගේ ප්‍රකාශය ප්‍රතික්ෂේප කළහ.

මුස්ලිම් සහෝදරවරුනි! සමහර විට අසුබ නිමිති බැලීම හෝ අසුබ සිතුවිලි නොදැනුවත්වම හදවතට ඇතුළු විය හැක. එනම් යම් යම් දේවල් පිළිබඳව අසුබවාදී හැඟීමක් අහම්බෙන් මෙන් ඇති විය හැක. මින් කිසිවෙකුටත් සම්පූර්ණයෙන්ම ආරක්ෂා විය නොහැක. යමෙකුට එසේ සිදු වී, ඔහු ඒ ගැන තැකීමක් නොකර, බියෙන් සහ බලාපොරොත්තුවෙන් යුතුව තම පරමාධිපතියා (අල්ලාහ්) කෙරෙහි විශ්වාසය තබා තමා කිරීමට අදහස් කළ දේ කරයි නම්, ඉන් ඔහුට කිසිදු හානියක් සිදු නොවේ. තවද ඔහු නබි (සල්) තුමාණන් අණ කළ පරිදි මෙසේ පැවසිය යුතුය: ඔබෙන් කෙනෙකු තමා අකමැති දෙයක් (අසුබ යැයි සිතෙන දෙයක්) දුටුවහොත් ඔහු මෙසේ පවසත්වා: 'යා අල්ලාහ්! ඔබ හැර වෙනත් කිසිවෙකුට යහපත ගෙන ආ නොහැක. තවද ඔබ හැර

**වෙනත් කිසිවෙකුට අයහපත ඉවත් කළ නොහැක. තවද ඔබගෙන් හැර වෙනත් කිසිදු වෙනසක් කිරීමට කිසිවෙකුට ශක්තියක් නොමැත.**

[ග්‍රන්ථය: අබූ දාවූද්]

නමුත් යමෙකු තමා අකමැති දෙයක් දැක හෝ අසා, ඒ හේතුවෙන් අසුබවාදී ලෙස සිතා තමා කිරීමට අදහස් කළ දෙයින් ඉවත් වන්නේ නම්, සැබවින්ම ඔහු වැරදි ක්‍රියාවක් කර ඇත. තවද විශාල පාපයකට ගොදුරු වී ඇත. එබැවින් ඔහු වහාම අල්ලාහ් වෙත පසුතැවී සමාව අයැදිය යුතුය. අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර් (රළියල්ලාහු අන්හුමා) තුමාණන්ගෙන් වාර්තා වේ: රසූල් වන මුහම්මද් (සල්)තුමාණන් මෙසේ පැවසූහ: **යමෙකු තමාගේ අවශ්‍යතාවයෙන් 'අත්-තියරා' (අසුබ නිමිති බැලීම) හේතුවෙන් ආපසු හැරෙන්නේද, ඔහු සැබවින්ම ෂිර්ක් කර ඇත.** සහාබාවරු විමසූහ: අහෝ අල්ලාහ්ගේ දූතයාණනි, ඒ සඳහා වන ප්‍රතිකර්මය (කෆ්ෆාරාව) කුමක්ද? එතුමාණෝ පැවසූහ: **ඔහු මෙසේ පැවසීමයි: 'යා අල්ලාහ්! ඔබගේ යහපත හැර වෙනත් යහපතක් නැත, ඔබගේ තීරණය (නියමය) හැර වෙනත් නිමිත්තක් නැත, තවද ඔබ හැර වෙනත් දෙවියෙකු නැත.**

[ග්‍රන්ථය: අහ්මද්].

එබැවින් මෙම අසත්‍ය විශ්වාසයන්ගෙන් ප්‍රවේශම් වීම සහ අන් අයට ඒ ගැන අනතුරු ඇඟවීම මුස්ලිම්වරයෙකුගේ අනිවාර්ය වගකීමකි. මන්දයත්, අසුබ නිමිති බලන්නා අල්ලාහ් කෙරෙහි ඇති තම විශ්වාසය බිඳ දමා, මිථ්‍යා (මනඃකල්පිත) කරුණක් සමඟ බැඳී සිටින බැවිනි. ඒ වෙනුවට ඔහු, සියලු කටයුතුවල පාලනය නිජ අතේ තබාගෙන සිටින තම පරමාධිපතියා වන (අල්ලාහ්) කෙරෙහි පූර්ණ විශ්වාසය තැබිය යුතුය. මෙම මිත්‍යාවන් හා අසත්‍ය විශ්වාසයන් ඔහුව ඔහුගේ අවශ්‍යතාවයෙන් ආපසු නොහැරවිය යුතුය.

අල්ලාහ් මටද ඔබටද අති උතුම් වූ අල් කුර්ආනය තුළින් ආශිර්වාද කරත්වා! එහි අඩංගු ආයත් සහ ප්‍රඥාවන්ත උපදෙස් තුළින් මටත් ඔබටත් ප්‍රයෝජනවත් කරත්වා! මගේ මෙම ප්‍රකාශය මෙතෙකින් අවසන් කරමි. මම මා වෙනුවෙන් ද ඔබලා වෙනුවෙන් ද සැම පාපයක් සඳහා අල්ලාහ්ගෙන් ම සමාව අයදිමි, තවද ඔහු වෙත පව් සමා අයදිමින් හැරෙන්නෙමි. සැබවින්ම ඔහු අතිශයින් කමා කරන්නා වූ ද, මහා කරුණාභරිත වූ පරම කරුණාභරිතයාණන් ය.

## දෙවන දේශනාව

සියලු ප්‍රශංසා ලෝකයන්හි පරමාධිපති වූ අල්ලාහ්ටම හිමිය. තවද ශ්‍රේෂ්ඨතම දූතයා වන අපගේ නබි මුහම්මද් (සල්) තුමාණන් කෙරෙහි ද, එතුමාණන්ගේ පවුලේ අය සහ සහාබාවරුන්, සියලු දෙනා කෙරෙහි ද අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය අත්වේවා!

ඉන්පසුව: පළමුව මා හටත් ඔබටත් අල්ලාහ්ට බිය වන ලෙස මම අනුශාසනා කරමි. මන්දයත්, යමෙකු අල්ලාහ්ට බිය වන්නේද  මහා කාරුණික අල්ලාහ් ඔහුව ආරක්ෂා කරයි, ඔහුව මුදවා ගනී, තවද ඔහුට රැකවරණය ලබා දෙයි.

මහා කාරුණික අල්ලාහ්ගේ ගැත්තනි! අසුබ නිමිති බැලීම සහ සුබවාදී වීම හෙවත් යහපත් නිමිති බැලීම අතර පැහැදිලි වෙනසක් ඇත. අසුබ නිමිති බැලීම ෂිර්ක් (අල්ලාහ්ට ආදේශ කිරීමක්) සහ තහනම් (හරාම්) වූ දෙයකි. එහෙත් සුබවාදී වීම යහපත් සහ දිරිගන්වන ලද ප්‍රිය ජනක (මුස්තහබ්) දෙයකි. අසුබ නිමිති බැලීම අල්ලාහ් සම්බන්ධයෙන් නරක සිතුවිලි ඇති කර ගැනීමකි. සුබවාදී වීම අල්ලාහ් සම්බන්ධයෙන් හොඳ සිතුවිලි ඇති කර ගැනීමකි. මුස්ලිම්වරයෙකු සෑම තත්ත්වයකදීම අල්ලාහ් සම්බන්ධයෙන් යහපත් සිතුවිලි ඇති කර ගැනීමට අණ කරනු ලැබ ඇත.

සුබවාදී වීම) යනු, කෙනෙකු අල්ලාහ් කෙරෙහි විශ්වාසය තබා යම් කාර්යයක් කිරීමට ආරම්භ කරන විට හෝ ඒ සඳහා අධිෂ්ඨාන කරගෙන සිටින විට, ඔහුට සතුට ගෙන දෙන යහපත් වචනයක් ඇසීමයි. එමඟින් ඔහු යොමු වූ කටයුත්ත කෙරෙහි ඔහුගේ උද්යෝගය සහ ඉදිරිපත් වීම වැඩි වේ, ඔහුගේ ළය පුළුල් වී සැනසීමක් දැනේ, තවද එය ඔහුගේ හදවතට සතුටක් ගෙන දෙයි. උදාහරණයක් ලෙස 'මුබාරක්' (ආශිර්වාද ලත්) යන නම ඇති අයෙකු දැකීමෙන් එම දිනය තුළ තමාට ආශිර්වාදය ලැබෙනු ඇතැයි සුබවාදීව සිතීම වැනි දේ මෙයට ඇතුළත් වේ.

අනස් (රළියල්ලාහු අන්හු) තුමාණන්ගෙන් වාර්තා වේ, නබි (සල්) තුමාණන් මෙසේ පැවසූහ: "**(ස්වාභාවිකවම රෝග බෝවීමක්) හෝ අසුබ නිමිති බැලීමක් ඉස්ලාමයේ නැත. තවද මම යහපත් සුබ නිමිති වලට ප්‍රිය කරමි, එනම් යහපත් වචනයයි.**

[ග්‍රන්ථය: බුහාරී සහ මුස්ලිම්].

**හුදෙයිබියා ගිවිසුමේදී, සුහයිල් ඉබ්නු අම්ර් (රළියල්ලාහු අන්හු) - එවකට ඔහු ප්‍රතික්ෂේප කරන්නෙකු ලෙස සිටියදී, නබි (සල්) තුමාණන් වෙත පැමිණියේය. එවිට එතුමාණෝ ඔහුගේ නම ඇසුරින් සුබවාදී වෙමින් (සුහයිල් යන්නෙහි තේරුම 'පහසු' යන්නයි) මෙසේ පැවසූහ: "ඔබගේ කාරණය ඔබට පහසු කරනු ලැබ ඇත.**

[ග්‍රන්ථය: බුහාරි].

ඉමාම් ඉබ්නු අල්-කයිම් (රහිමහුල්ලාහ්) තුමාණන් මෙසේ පැවසීය:යහපත් වචනයකින් සුබවාදී වීම සහ එයට ප්‍රිය කිරීම තුළ ෂිර්ක් වල කිසිඳු සලකුණක් නොමැත. ඒ වෙනුවට එය තමාට ප්‍රයෝජනවත් වන සහ ගැළපෙන දේට නැඹුරු වන මනුෂ්‍ය ස්වභාවයේ සහ සහජ බුද්ධියේ අවශ්‍යතාවය ප්‍රකාශ කිරීමකි.

එබැවින් ඔබේ පරමාධිපතියා (අල්ලාහ්) කෙරෙහි යහපත් සිතුවිලි ඇති කරගන්න. ඔබේ සියලු කටයුතුවලදී ඔහු කෙරෙහි පමණක් විශ්වාසය තබන්න අල්ලාහ් පිළිබඳව නරක සිතුවිලි ඇති කරගැනීමෙන් ඔබව ආරක්ෂා කරගන්න. මන්දයත් ඔහුගේ සියලු තීරණ යහපත් වන බැවිනි. යමෙකු අල්ලාහ් හැර වෙනත් යම් දෙයක් මත රඳා පවතින්නේ නම්, ඔහුව එම දෙයටම භාර දෙනු ලැබේ.

**{මා ඔහු (අල්ලාහ්) කෙරෙහිම විශ්වාසය තැබුවෙමි, තවද මා ඔහු වෙතටම (පසුතැවී) යොමු වෙමි.}**

[හූද්: 88]

යා අල්ලාහ්! ඔබ විසින් අනුමත (හලාල්) කළ දෑ මගින් ප්‍රමාණවත් කර, ඔබ තහනම් (හරාම්) කළ දැයින් අපව ආරක්ෂා කරනු මැනව. තවද ඔබගේ අනුග්‍රහයෙන් ඔබ හැර අන් කිසිවෙකු මත යැපීමෙන් අපව මුදා ස්වයංපෝෂිත කරනු මැනව.

යා අල්ලාහ්! අපගේහදවත් තුළ විශ්වාසය ප්‍රියජනක කරනු මැනව, තවද එය අපගේ හදවත් තුළ අලංකාරවත් කරනු මැනව. ප්‍රතික්ෂේප කිරීම, පාපතර ක්‍රියා සහ අකීකරුකම අපට පිළිකුල් කරනු මැනව. තවද අපව යහමඟ ගිය ජනයින් අතරට එක් කරනු මැනව.

යා අල්ලාහ්! ඉස්ලාමයට සහ මුස්ලිම්වරුන්ට ගෞරවය හා ජයග්‍රහණය ලබා දෙනු මැනව. ෂිර්ක් දේව ආදේශය සහ දේව ආදේශකයින් නින්දාවට පත් කරනු මැනව. තවද ඔබගේ දහමටත්, ඔබගේ ග්‍රන්ථයටත්, ඔබගේ නබි (සල්) තුමාණන්ගේ සුන්නාවටත්, ඔබගේ විශ්වාසවන්ත ගැත්තන්ටත් උදව් කරනු මැනව.

යා අල්ලාහ්! මුස්ලිම් පිරිමින්ට සහ කාන්තාවන්ට ද, විශ්වාසවන්ත පිරිමින්ට සහ කාන්තාවන්ට ද, ඔවුන් අතුරින් ජීවතුන් අතර සිටින්නන්ට සහ මියගිය සියලු දෙනාට ද සමාව ලබා දෙනු මැනව.

යා අල්ලාහ්! අපගේ පාලකයාට සහ කිරුළ හිමි කුමරුට ද ඔබගේ යහමඟ කරා යාමට මඟ පෙන්වනු මැනව. ඔවුන් දෙදෙනාගේ ක්‍රියාවන් ඔබට කීකරු වන සහ ඔබගේ තෘප්තිය ගෙන දෙන ඒවා බවට පත් කරනු මැනව. තවද මෙම දේශය ආරක්ෂිත, සන්සුන්, සෞභාග්‍යමත් සහ සශ්‍රීකමත් දේශයක් බවට පත් කරනු මැනව. එය ආරක්ෂාවේ සහ විශ්වාසයේ නිවහනක් බවට පත් කරනු මැනව. සෙසු සියලුම මුස්ලිම් දේශයන් ද එලෙසම පත් කරනු මැනව.